දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපෑල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk


**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.


මගේ අංකය
எனது இல.
My No.
PSC/APL/13/AT/Agriculture/2026

ඔබේ අංකය
உமது இல.
Your No.
Agri/AD/E5/කෘ.උ./15

දිනය
திகதி
Date
2026.06.12

**ලේකම්**
කෘෂි කර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය මඟින්,

**කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්**
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම**

**කෘෂිකර්ම උපදේශක, පර්යේෂණ සහකාර සහ තාක්ෂණ සහායක**

ඉහත සඳහන් සේවාවන්හි නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති මෙම අභියාචනා අතරින් ක්‍රියාත්මක විය යුතු දිනය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියලු ස්ථාන මාරු වහාම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව, කෘෂිකර්ම උපදේශක, පර්යේෂණ සහකාර සහ තාක්ෂණ සහායක යන සේවාවන්හි නිලධාරීන්ගේ 2026 වර්ෂයේ මෙතෙක් ක්‍රියාත්මක වී නොමැති සියලු වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලෙසත්, වාර්ෂික ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක වීම සඳහා වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථාන මාරුවීම් ද එම දින සිට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු වේ.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

05. 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම සියලුම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේ ද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙස ද ඔබ වෙත දන්වා සිටිමි.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257(V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

07. එසේම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

Nday

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත්:

01. ලේකම්, කෘෂි කර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - කරු.අ.ක.ස
02. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කරු.අ.ක.ස

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා - 2026 සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ - කෘෂිකර්ම උපදේශක

| අනු අංකය | නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රා.සේ.කො. තීරණ |
|---|---|---|---|---|
| 1 | එච්.එම්.අයි.සී. රුවන්තිකා මිය | ජාතික ශාක නිරෝධායන සේවය, කටුනායක | පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, හොරණ | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක කිරීම සහ ඉදිරියේදී සිදු කරන නව බඳවා ගැනීම්වලින් අනුප්‍රාප්තිකයෙකු ලබා දී මෙම නිලධාරිනිය වෙත පහසු සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරුවක් ලබා දීමට සලකා බලන ලෙස කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම |
| 2 | එම්.අයි.එෆ්. ශෆ්නා මිය | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාලය, අම්පාර | රජයේ බීජ නිෂ්පාදන ගොවිපළ, මල්වත්ත | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක කිරීම |
| 3 | ඩී.ඩබ්.ඩී.සී. බණ්ඩාර මයා | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාලය, පැල්වෙහෙර | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අ/ප) කාර්යාලය, අනුරාධපුරය | අභියාචනයට ඉඩ දෙමින් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය අනුව මෙම නිලධාරියාගේ නව සේවා ස්ථානය බීජ සහතික කිරීමේ සේවය, පැල්වෙහෙර ලෙස සංශෝධනය කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| 4 | ඒ.එෆ්. රීසා මිය | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අ/ප) කාර්යාලය, පොළොන්නරුව | කෘෂි ව්‍යාපාර හා සංවර්ධන අංශය, ගන්නෝරුව (පොළොන්නරුව) | අභියාචනය ප්‍රතික්ෂේප කරමින් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය අනුව මෙම නිලධාරිනියගේ නව සේවා ස්ථානය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අ/ප) කාර්යාලය, අනුරාධපුරය ලෙස සංශෝධනය කිරීම සහ කෘෂි ව්‍යාපාර හා සංවර්ධන අංශය ගන්නෝරුව (පොළොන්නරුව) හි ඇති වන පුරප්පාඩුව සඳහා නව බඳවා ගැනීම්වලින් නව නිලධාරියෙකු අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙස කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම |
| 5 | එච්.ඩී. පාලිත ගුණරත්න මහතා | කෘෂි ව්‍යාපාර හා සංවර්ධන අංශය, ගන්නෝරුව (කළුතර) | ජාතික ශාක නිරෝධායන සේවය, කටුනායක | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක කිරීම |

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා - 2026 සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ - තාක්ෂණ සහායක

| අනු අංකය | නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රා.සේ.කො. තීරණ |
|---|---|---|---|---|
| 1 | වී. දිලුක්ෂා මිය | ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, කිලිනොච්චිය | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය) කාර්යාලය, යාපනය | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය අනුව ජාතික ශාක නිරෝධායන සේවය යටතේ පවතින කන්කසන්තුරේ, වරායෙහි පිහිටුවා පවත්වාගෙන යනු ලබන පාරු සේවා ශාක නිරෝධායන ඒකකයේ කටයුතු සඳහා අනුයුක්ත කිරීමට යාපනය ගුවන්තොටුපල, ශාක නිරෝධායන ඒකකය වෙත මෙම නිලධාරිනියගේ ස්ථාන මාරු නියෝගය සංශෝධනය කිරීම |
| 2 | ඩබ්.පී. සම්පත් ද සිල්වා | වී පර්යේෂණ ස්ථානය, බෙන්තොට | මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීම සහ ඉදිරියේ දී සිදු කරන නව බඳවා ගැනීම්වලින් අනුප්‍රාප්තිකයකු ලබා දී මෙම නිලධාරියාට පහසු සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරුවක් ලබා දීමට සලකා බලන ලෙස කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම |

| | | | | |
|---|---|---|---|---|
| 3 | වී. නිරූෂන් මයා | පාලමුණ (කෘෂි ව්‍යාප්ති කාර්යාලය) නි.කෘ.අ. (අ.ප.) කාර්යාලය, අම්පාර | කෘෂිකර්ම විද්‍යාලය, පාලමුණ | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක කිරීම |

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා - 2026 සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ - පර්යේෂණ සහකාර**

| අනු අංකය | නම | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රා.සේ.කො. තීරණ |
|---|---|---|---|---|
| 1 | ඒ.ඩී.එස්.එස්. රණතුංග මයා | ශාක නිරෝධායන ස්ථානය, කොළඹ වරාය | උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගිරාදුරුකෝට්ටේ | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් සමාලෝචන කමිටු තීරණය ක්‍රියාත්මක කිරීම |
| 2 | ඩබ්.ටී.එස්.එස්. වික්‍රමසිංහ මයා | පළතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, හොරණ | ජා.පැ.නි. සේවය, කටුනායක | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක කිරීම සහ ඉදිරියේදී සිදු කරන ලද නව බඳවා ගැනීම්වලින් අනුප්‍රාප්තිකයෙකු ලබා දී මෙම නිලධාරියාට පහසු සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරුවක් ලබා දීමට සලකා බලන ලෙස කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම |
| 3 | බී.ඒ.ආර්. මධුෂාණි මිය | වී පර්යේෂණ ස්ථානය, අම්බලන්තොට | කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, තෙලිජ්ජවිල | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් සමාලෝචන කමිටු තීරණය ක්‍රියාත්මක කිරීම |
| 4 | එන්.ටී. ප්‍රතාපසිංහ මිය | ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බෝඹුවල | පළතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, හොරණ | අභියාචනාවලට ඉඩ දෙමින් මෙම නිලධාරීන්ගේ ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක වන දිනය 2026.09.01 දින ලෙස සංශෝධනය කිරීම |
| 5 | ජේ.ඩී.සී. දිනේෂ් මයා | පළතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, හොරණ | ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බෝඹුවල | |

| | | | | |
|---|---|---|---|---|
| 6 | ඩී.ඩී. ගුණවර්ධන මයා | පළතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, හොරණ | ප්‍රාදේශීය වී පර්යේෂණ ස්ථානය, අම්බලන්තොට | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක කිරීම |
| 7 | ඩී.එම්.ඩී.පී. මාපාගෙදර මිය | උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව | වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක කිරීම |
| 8 | ආර්.එල්.ආර්.ජී.එස්. රාජපක්ෂ මිය | තිරසර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, මාකඳුර | වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ | අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක කිරීම සහ ඉදිරියේ දී සිදු කරන ලද නව බඳවා ගැනීම්වලින් අනුප්‍රාප්තිකයෙකු ලබා දී මෙම නිලධාරියාට පහසු සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරුවක් ලබා දීමට සලකා බලන ලෙස කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම |